# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## කොළඹ භාෂා කුසලතා සහ නාට්‍ය කලා සංගමය
## (සංස්ථාගත කිරීමේ)

**කොළඹ භාෂා කුසලතා සහ නාට්‍ය කලා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

මඩකලපුව දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී
ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා විසින්
2024 ජුනි මස 20 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2024 ජුනි මස 06 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

**[267 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල :** රු. 24.00 **තැපැල් ගාස්තුව :** රු. 150.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## කොළඹ භාෂා කුසලතා සහ නාට්‍ය කලා සංගමය (සංස්ථාගත කිරීමේ)

## කොළඹ භාෂා කුසලතා සහ නාට්‍ය කලා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව

"කොළඹ භාෂා කුසලතා සහ නාට්‍ය කලා සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් විසින් එකඟ වූ රීතිවලට අනුකූලව, එකී සංගමයේ පරමාර්ථ කාර්යක්ෂමව කරගෙනයෑමේ සහ ඉහත සඳහන් සංගමය හා සම්බන්ධ සියලු කාරණා ඉටුකිරීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකාව තුළ මෙතෙක් කල් පිහිටුවා තබූ හෙයින් ද:

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, එම පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, ඒ ඉල්ලීම ඉටුකිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

1. මේ පනත 2024 අංක      දරන කොළඹ භාෂා කුසලතා සහ නාට්‍ය කලා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

කොළඹ භාෂා කුසලතා සහ නාට්‍ය කලා සංගමය සංස්ථාගත කිරීම

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන්පසු (මෙහි මින්මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) කොළඹ භාෂා කුසලතා සහ නාට්‍ය කලා සංගමයේ මෙතෙක් සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරගනු ලබන සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් මින්මතු ඇතුළත් කරනු ලබන සියලු තැනැත්තන් (මෙහි මින්මතු "සංස්ථාපිත මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) "කොළඹ භාෂා කුසලතා සහ නාට්‍ය කලා සංගමය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු ය. තව ද, ඒ සංස්ථාපිත මණ්ඩලය විසින් ද, එයට විරුද්ධව ද එකී නාමයෙන් නඩු පැවරීමේ සහ නඩු පවරනු ලැබීමේ හැකියාව ඇති අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමට ද, එය භාවිත කිරීමට ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමට ද පූර්ණ බලය සහ අධිකාරය එකී සංස්ථාපිත මණ්ඩලයට ඇත්තේ ය.

සංස්ථාපිත මණ්ඩලයේ පොදු පරමාර්ථ

**3.** (1) සංස්ථාපිත මණ්ඩලය සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පාරමාර්ථ සඳහා ද, එම පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:-

(අ) භාෂා සන්නිවේදන සහ කාර්යසාධන කුසලතා සම්බන්ධයෙන් සුදුසුකම්ලත් සහ පළපුරුද්දක් සහිත විභාග පරීක්ෂකවරුන්ගේ මණ්ඩලයක් බඳවාගෙන, පුහුණුකර එම මණ්ඩලය පවත්වාගෙන යෑම සහ ඉංග්‍රීසි භාෂාව කථා කිරීම, නාට්‍යකරණය, පද්‍ය, ගද්‍ය, ඉංග්‍රීසි භාෂා කථනය, ඉංග්‍රීසි කථනය සහ ලිවීම, පුද්ගල සහ වෘත්තීය ඉංග්‍රීසි භාෂාව පිළිබඳ විභාග පැවැත්වීම මඟින් කුසලතා සහතික පත්‍ර ප්‍රදානය කිරීම; සහ

(ආ) (i) අයදුම්කරුවන්ගේ අවශ්‍යතා නිරූපණය වන පරිදි වාචික භාෂා සන්නිවේදනය සහ ලලිතකලා පිළිබඳ පුළුල් විවිධත්වයකින් යුතු විෂය නිර්දේශ සකස් කිරීම;

(ii) අභියෝගාත්මක පුහුණු ක්‍රමවේද සහ විභාග පරීක්ෂකවරුන්ගෙන්, ගුරුවරුන්ගෙන් සහ අයදුම්කරුවන්ගෙන් ලැබෙන අදහස්වලට ප්‍රතිචාර දක්වමින් මෙම විෂය නිර්දේශ නිරන්තර අධීක්ෂණයට ලක්කිරීම;

(iii) විෂය නිර්දේශයේ සඳහන් ආකාරයට සාධාරණ විභාග පැවැත්වීම;

(iv) එම විභාග පිළිබඳ සාධාරණ දැනුම්දීමක් අදාළ පුද්ගලයන් සහ විභාග පරීක්ෂණ මධ්‍යස්ථාන වෙත ලබාදීම; සහ

(v) අත්‍යාවශ්‍ය පරීක්ෂාකිරීමේ කාර්ය පටිපාටි ආරක්ෂාකරමින් හැකිතාක් ඉක්මණින් ප්‍රතිඵල රැස්කරගෙන බෙදාහැරීම;

(ඇ) ගුරුවරුන් සඳහා මාර්ගෝපදේශයක් වශයෙන් ශ්‍රේණිගත කිරීමේ විභාග භාවිත කිරීම සඳහා හැකියාව ලැබෙන පරිදි ශිෂ්‍ය තොරතුරුවල කොටසක් සංයුක්තවන විෂය නිර්දේශ ඇතුළත් පොතපත තෝරාගැනීම;

(ඈ) සිසුන්ගේ ඉහළ හැකියා මට්ටම් දක්වා ඔවුන්ගේ කුසලතා පුළුල් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සිදුවන පරිදි සිසුන්ට

විවිධ විෂයන් හි දී උචිත ශ්‍රේණි සහ ඩිප්ලෝමා විභාග ලබාගැනීම සඳහා සිසුන්ව උනන්දු කරවීම;

(ඉ) ඉංග්‍රීසි කථනය, නාට්‍ය සහ ආශ්‍රිත විෂයන් පිළිබඳ ගුරුවරුන් අතර සමීපතම සුහදශීලී බැඳීමක් සහ අවබෝධයක් ඇතිකිරීම සහ ඒ සඳහා උනන්දු කරවීම;

(ඊ) කථනය, නාට්‍යකරණය සහ ආශ්‍රිත විෂයන් පිළිබඳව ඉංග්‍රීසි භාෂාවෙන් ගුරු පුහුණු වැඩසටහන්, වැඩමුළු සහ සම්මන්ත්‍රණ නිතරම පැවැත්වීම;

(උ) පුද්ගලික සහ වෘත්තීය භාෂා සන්නිවේදන කුසලතා ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂිත ඉංග්‍රීසි භාෂා පාඨමාලා පැවැත්වීම; සහ

(ඌ) රජය, වෘත්තීය සහ අධ්‍යාපන ආයතන සහ වෙනත් ඒ සඳහා උනන්දුවක් දක්වන තැනැත්තන් සහ ආයතන වෙත, අවශ්‍ය වේ නම් වාචික සන්නිවේදනය සහ නාට්‍ය කලාවට අදාළ කාරණා සම්බන්ධයෙන් වූ සංස්ථාපිත මණ්ඩලයේ අදහස් විමසා දැනගැනීම සඳහා අවස්ථාවක් සලසාදීම.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ දී, සංස්ථාපිත මණ්ඩලය විසින් ජාතිය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී-පුරුෂ භාවය, දේශපාලන මතය, උපන් ස්ථානය හෝ වෙනත් යම් හේතුවක් මත වන යම් වෙනසකින් තොරව එකී ක්‍රියාත්මක කිරීම සිදුකිරීමට වගබලා ගත යුතු ය.

රජයේ හෝ පළාත් සභාවක අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක කාර්ය සමග කිසිදු ගැටුමක් ඇති නොවන බවට සංස්ථාපිත මණ්ඩලය විසින් වග බලා ගත යුතු බව

**4.** සංස්ථාපිත මණ්ඩලයේ කාර්යය සහ රජයේ හෝ යම් පළාත් සභාවක යම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් සමගාමීව කරගෙන යන්නා වූ යම් කාර්යයන් අතර කිසිදු ගැටුමක් නිර්මාණය නොවන ආකාරයකින් සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය

**5.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) එම සභාව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය; එනම්-

(අ) සභාපතිවරයා;

(ආ) උප සභාපතිවරයා;

(ඇ) ගරු මහලේකම්වරයා;

(ඈ) ගරු සහකාර ලේකම්වරයා;

(ඉ) ගරු භාණ්ඩාගාරික;

(ඊ) ගරු සහකාර භාණ්ඩාගාරික;

(උ) සභාපති-විභාග මණ්ඩලය;

(ඌ) විභාග මණ්ඩලයේ ගරු ලේකම්වරයා;

(එ) ආරම්භක අධ්‍යක්ෂවරුන් දෙදෙනකු;

(ඒ) 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට අනුකූලව තෝරාගනු ලබන හෝ පත්කරනු ලබන වෙනත් යම් සාමාජිකයකු.

(3) (අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී කොළඹ භාෂා කුසලතා සහ නාට්‍ය කලා සංගමයේ එම සභාවේ ධුර දරන සාමාජිකයන් 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට පළමුවන සභාව පත්කරනු ලබන තෙක් තෝරා පත්කර ගනු ලබන තෙක් අතුරු කමිටුවක් ලෙස ක්‍රියාත්මක විය යුතු ය.

(ආ) සංස්ථාපිත මණ්ඩලයේ අතුරු පරිපාලනය සහ සංස්ථාපිත මණ්ඩලයේ පළමුවන සභාවේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම හෝ පත්කර ගැනීමට අදාළ රීති සෑදීම සඳහා අතුරු කමිටුවට බලය ඇත්තේ ය.

(ඇ) අතුරු කමිටුවේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් හය දෙනකු විය යුතු ය.

(ඈ) අතුරු කමිටුවේ යම් තීරණයක් රැස්වීමට පැමිණ සිටින එහි සාමාජිකයන්ගේ බහුතරය විසින් ගනු ලැබිය යුතු ය.

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ ප්‍රථම සභාව, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට වසරක් ඇතුළත පත්කරනු හෝ තෝරා පත්කරනු ලැබිය යුතු ය.

(4) (අ) සභාවේ සෑම නිලධරයකුම වාර්ෂික මහා සභා රැස්වීමේ දින සිට එක් අවුරුදු කාලසීමාවක් සඳහා පත් කිරීම හෝ තෝරා පත්කිරීම කරනු ලැබිය යුතු අතර, එවැනි යම් නිලධරයකු එකී අවුරුද්දක කාලසීමාව අවසන්වීමෙන් පසුව නැවත පත්කිරීම හෝ නැවත තෝරා පත්කිරීම සඳහා සුදුස්සකු විය යුතු ය:

එසේ වුව ද, සභාවේ සභාපතිවරයා, උප සභාපතිවරයා, භාණ්ඩාගාරික, සහකාර භාණ්ඩාගාරික සහ සංස්ථා සාමාජිකයන් අඛණ්ඩ වාර තුනකට වැඩි වාරගණනක් සඳහා ධුර දරනු නොලැබිය යුතු ය.

(ආ) යම් ධුර දරන්නකු මියයෑම, ඉල්ලා අස්වීම, අශක්නුතාවයට පත්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී, සභාව විසින්, සංස්ථාපිත මණ්ඩලයේ රීති සැලකිල්ලට ගෙන එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු තෝරා පත්කර ගැනීම හෝ පත්කර ගැනීම කරනු ලැබිය යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ තෝරා පත්කර ගනු ලබන හෝ පත්කර ගනු ලබන තැනැත්තා, ඔහු අනුප්‍රාප්තවන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත්නොවී ඇති කාලය සඳහා පමණක් ධුරය දරනු ලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ බලතල

**6.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයට පහත දැක්වෙන බලතල ඇතුළුව එහි පරමාර්ථ හෝ ඒවායින් කිසිවක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා හෝ යෝග්‍ය යම් හෝ සියලු ක්‍රියා සහ කාරණා කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය තිබිය යුතු යː-

(අ) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ගේ සුභසිද්ධියට බලපාන කරුණු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම;

(ආ) සංස්ථාපිත මණ්ඩලයේ වෘත්තීයමය ක්‍රියාකාරකම් ක්‍රමවත් කිරීම සහ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ගේ සාමාන්‍ය ක්‍රියා කලාපයන් හි ඉහළ තත්ත්වයන් පත්වාගෙන යෑම සහතික කිරීම;

(ඇ) රීති මගින් නිශ්චිතව දක්වනු ලබන යම් සාමාජිකයන් සංඛ්‍යාවකින් සමන්විතවන විභාග මණ්ඩලයක්, උපදේශක මණ්ඩලයක් සහ විනය කමිටුවක් ස්ථාපිත කිරීම;

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම;

(ඉ) ව්‍යවස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීම, අත් කර ගැනීම, කුලියට ගැනීම, ඉදිකිරීම, අලුත්වැඩියා කිරීම සහ අන්‍යාකාරයකින් ලබා ගැනීම සහ සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව යෝග්‍යයැයි සලකනු ලැබිය හැකි පරිදි ඒවා සම්බන්ධයෙන් කටයුතු කිරීම හෝ බැහැර කිරීම;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා හෝ එහි බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන පරිදි සෘජුවම හෝ තත්කාර්යය සඳහා සංස්ථාපිත මණ්ඩලය විසින් බලය පවරන ලද යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මඟින්, අවශ්‍ය විය හැකි සියලු කොන්ත්‍රාත්තු හෝ ගිවිසුම්වලට ඇතුළත්වීම සහ ඒවා ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම;

(උ) ඇප සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම හෝ අරමුදල් රැස්කිරීම සහ මුදලින් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම:

එසේ වුව ද, සංස්ථාපිත මණ්ඩලයට ලැබෙන සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් සභාව විසින් විදේශීය සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබාගත යුතු වේ;

(ඌ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධක පත්‍ර සකස් කිරීම, ලිවීම, භාර ගැනීම, වට්ටම් කිරීම, පිටසන් කිරීම, ගනුදෙනු කිරීම, මිලට ගැනීම, විකිණීම සහ නිකුත් කිරීම සහ යම් බැංකුවක ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම;

(එ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල්, සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකට ආයෝජනය කිරීම;

(ඒ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් යම් නීත්‍යනුකූල භාරයක් හෝ නිශ්චල හෝ පෞද්ගලික දේපළක් භාර ගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ පරිපාලනය කිරීම;

(ඔ) සංස්ථාපිත මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම, සේවයෙන් පහකිරීම හෝ සේවය අවසන් කිරීම සහ ඔවුන් සම්බන්ධයෙන් විනය පාලනය පවත්වාගෙන යෑම සහ සංස්ථාපිත මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි ඔවුන්ට වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීම;

(ඕ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම උදෙසා දේශන, සම්මන්ත්‍රණ සහ සමුළු සංවිධානය කිරීම;

(ක) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙනත් දේශීය සහ විදේශීය ආයතන සමග සබඳතා පවත්වාගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීම;

(ග) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයන් හි දී තැනැත්තන් පුහුණු කිරීම; සහ

(ච) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ නිසි ලෙස සහ ඵලදායී ලෙස පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය වෙනත් සියලු දේ ඉටු කිරීම.

සංස්ථාපිත මණ්ඩලයේ රීති

**7.** (1) සංස්ථාපිත මණ්ඩලය විසින්, සංස්ථාපිත මණ්ඩලයේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය ලබා දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතේ විධිවිධානවලට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන රීති, පහත සඳහන් කරුණු සියල්ල හෝ ඉන් කිසිවක් සඳහා, කලින් කල සෑදීම නීත්‍යනුකූල වන්නේ යː-

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයන්ගේ කෙටි තනතුරු නාමයන්, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවනු ලැබිය යුතු දායක මුදල්;

(ආ) සභාවේ ධුර දරන්නන් තෝරා පත් කර ගැනීම හෝ ධුර දරන්නන් ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) විභාග මණ්ඩලයේ, උපදේශක කමිටුවේ සහ විනය කමිටුවේ සංයුතිය, එකී මණ්ඩලයේ සහ කමිටුවල නිලධරයන්ගේ ධුර කාලය, එකී මණ්ඩලයේ සහ කමිටුවල බලතල, කාර්ය සහ කර්තව්‍ය, විභාග මණ්ඩලයේ ලේකම්වරයාගේ කර්තව්‍ය, විභාග මණ්ඩලය නම් කිරීම, සහ එකී මණ්ඩලයට සහ කමිටුවලට අදාළ වෙනත් යම් කරුණු;

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ පත් කිරීමේ නියම සහ කොන්දෙසි, බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඉ) සභාවේ හෝ එහි යම් අනුකමිටුවක රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එකී රැස්වීම් පිළිබඳ දැන්වීම් හා න්‍යාය පත්‍ර, ගණපූරණය සහ එකී රැස්වීම්වල කටයුතු කරගෙන යාම;

(ඊ) සභාවේ සහ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයකු වීමට සුදුසුකම් හා නුසුදුසුකම් සහ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ගේ විනය නීති සංග්‍රහය;

(උ) සංස්ථාපිත මණ්ඩලයේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම; සහ

(ඌ) සාමාන්‍යයෙන් සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම, එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීම.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින්, සාදන ලද යම් රීතියක්, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීති, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(4) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් සෑම අවස්ථාවක දී ම සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත් විය යුතු ය.

සාමාජිකයන්ගේ නාමලේඛනය

**8.** සභාව විසින්, සාමාජිකයන්ගේ නම, ලිපිනය සහ වෙනත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කළ යුතු සාමාජික නාමලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ අරමුදල

**9.** (1) සංස්ථාපිත මණ්ඩලයට එහි ම අරමුදලක් තිබිය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය සඳහා සහ සංස්ථාපිත මණ්ඩලය වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සාමාජික මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලු මුදල් සභාව විසින් අනුමත කරනු ලබන බැංකුවක හෝ ඊට වැඩි සංඛ්‍යාවක සංස්ථාපිත මණ්ඩලයේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හා ඉටු කිරීමේ දී සංස්ථාපිත මණ්ඩලය විසින් දරනු ලබන යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය

**10.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින්, සංස්ථාපිත මණ්ඩලයේ ආදායම් සහ වියදම්, වත්කම් හා බැරකම් සහ අනෙකුත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) සංස්ථාපිත මණ්ඩලයේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව පත්කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්-

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තකු ;හෝ

(ආ) යම් ගණකාධිකාරි සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, ගණකාධිකාරි සමාගමක්,

අදහස් වේ.

වාර්ෂික වාර්තාව

**11.** (1) සභාව විසින් සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු පිළිබඳ වාර්තාවක් එක් එක් මුදල් වර්ෂය සඳහා සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව, අදාළ වන වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේ සය මාසයක් ඉකුත්වීමට පෙර විගණකාධිපතිවරයා විසින් හෝ විගණකාධිපතිවරයා විසින් පත්කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් සහතික කරන ලද, විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශයක් සමග ඒ වාර්තාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ

43 වන ව්‍යවස්ථාව හෝ 44 වන ව්‍යවස්ථාව යටතේ අධ්‍යාපන විෂයය පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) මුදල් වර්ෂය තුළ දී සංස්ථාපිත මණ්ඩලය වෙත ලැබුණු විදේශීය සහ දේශීය මුදල් පිළිබඳ වෙනම ගිණුම් ප්‍රකාශයක් (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාවට අමුණා තිබිය යුතු ය.

*කොළඹ භාෂා කුසලතා සහ නාට්‍ය කලා සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට අයවිය යුතු ණය*

**12.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී කොළඹ භාෂා කුසලතා සහ නාට්‍ය කලා සංගමය විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලය විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට කොළඹ භාෂා කුසලතා සහ නාට්‍ය කලා සංගමයට අයවිය යුතු සියලු ණය සහ සංගමයට ගෙවිය යුතු සාමාජික මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලය වෙත ගෙවනු ලැබිය යුතු ය.

*සංස්ථාපිත මණ්ඩලය විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව*

**13.** මේ පනතේ විධිවිධානවලට යටත්ව, යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයදනයක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සංස්ථාපිත මණ්ඩලය සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට, නීතියෙන් සංස්ථාපිත මණ්ඩලයට හැකියාව සහ බලය ඇති අතර, එකී දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදුදීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් එය නීයාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත්ව, මේ පනතේ කාර්යය සඳහා සංස්ථාපිත මණ්ඩලය විසින් එකී සියලු දේපළ දරනු ලැබිය යුතු ය.

*මුදල් සහ දේපළ අදාළ කර ගැනීම*

**14.** කවර හෝ ආකාරයකින් ලබා ගන්නා සංස්ථාපිත මණ්ඩලයේ මුදල් සහ දේපළ හුදෙක් ම සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම උදෙසා පමණක් අදාළ කරගනු ලැබිය යුතු අතර, ඉන් කිසිඳු කොටසක් සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ට ලාභාංශ, ප්‍රසාද දීමනා හෝ ලාභ වශයෙන් කවර හෝ ලෙස සෘජුව හෝ වක්‍රව ගෙවනු හෝ පවරනු නොලැබිය යුතු ය.

*සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව*

**15.** (1) සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස, සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව, කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව, සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි යම් ධුර දරන නිලධරයකු භාරයේ තැබිය යුතු ය.

**විසුරුවා හැරීමක දී ඉතිරි වන දේපළ**

**16.** (1) සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වී තිබුණහොත්, එම දේපළ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලැබ ඇත්තා වූ ද, වෙනත් යම් උචිත ආයතනයකට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා උචිත ආයතනය සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමට පෙරාතුව ම සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් විසින් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

**ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම**

**17.** මේ පනතේ සඳහන් කිසිවකින් ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ වෙනත් යම් සංස්ථාවක අයිතිවාසිකම්වලට හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව්**

**18.** මෙම පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.